**ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව - 2021**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ අවසානයේ ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු. 3,809,453ක් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස අනාවරණය කර නොතිබුණි. | දෝෂයකින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. 2022 වර්ෂයේ නිවැරදි කරනු ලැබේ. | ලැබිය යුතු දෑ ගිණුම්වල අනාවරණය කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු කුලී හා බදුකුලී, ලේඛනය අනුව හිඟහිටි රු.3,737,404ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු. 8,634,121 ක් ලෙස අනාවරණය කර තිබුණි. | පසුගිය වර්ෂයේ ලේඛන පරිශීලනය කර වැරදි නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | විචලනයන් හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් රු 358,414,232 ක් වටිනා වත්කම් ගිණුම් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය, වටිනාකම සනාථ කිරීමේ ලියකියවිලි සහ අයිතිය සනාථ කිරීමේ ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා ලේඛන සකස් කර ඇත. ඒවා ලේඛනගත කරමින් පවතී. අනෙකුත් ඒවා සඳහා ලේඛන පවත්වාගෙන යනු ලැබේ. | වත්කම් සඳහා ලිඛිත සාක්ෂි ලබගැනීමට පියවර ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (අ) | මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් ලෙස ලබාදුන් රු.6,370,413ක් වර්ෂ 02කට අධික කාලයක් ඉක්මවා ඇතත් අයකරගෙන නොතිබුණි. | ඉදිරි අනාගතයේදි මෙය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | අත්තිකාරම් අදාල අයගෙන් අයකර ගැනිමට පියවර ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 571(1) සහ (2) | තැන්පත්කර වර්ෂ 02ක් ඉක්ම වූ තැන්පතු රු.1,717,008ක් නියාදනය කර නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 83,880,400 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 44,622,683ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරීම්වල කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂ අවසානය දක්වා පැවැති හිඟ කුලි සහ බදු රු.8,634,121ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තැන්පතු සහ අඩුකිරීම් සඳහා අඩුකළ වටිනාකම වර්තමානයේ අයකරමින් පවතී. | හිඟ කුලි සහ බදු අයකිරීමේ ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ආ) | එක් සිනමා ශාලාවකින් අයවිය යුතු විනෝද බදු රු.992,081ක් වර්ෂ කිහිපයක සිට අයකර ගැනීමකින් තොරව හිඟහිටව පැවැතුණි. එනමුත් එම සිනමා ශාලාව අඛණ්ඩව ක්‍රියාත්මකවී තිබුණු අතර පසුගිය වර්ෂ 03ක කාලයක් විනෝද බදු ගණනය කිරිම් සිදුකර නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන අයකිරිමට අවශ්‍ය පියවර ගත යුතුය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ ගාස්තු රු. 49,310,700ක් සහ මුද්දර ගාස්තු රු.15,555,000ක් ලැබිය යුතුව තිබුණි. | වර්තමානයේ සියළුම මුද්දර ගාස්තු පරික්ෂා කර ලැබිය යුතු සියළුම ගාස්තු නිරවුල් කරනු ලැබේ. | දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු අයකරගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | අනෙකුත් රාජ්‍ය ආයතනවලින් පරිත්‍යාග ලෙස ලැබූ සහ භාවිතා කරනු ලබන වාහන 09ක් සභාවේ නමට හිමිකාරිත්වය මාරුකර නොතිබුණි. | සභාවේ නමට හිමිකාරිත්වය මාරු නොකළ වාහන ඉතාමත් ඉක්මනින් පවරා ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | සභාවේ නමට හිමිකාරිත්වය මාරු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ආ)** | 2018 වර්ෂයෙන් පසුව පසුගිය වර්ෂ 03ක කාලයක් සඳහා පුස්තකාල පොත් සමීක්ෂණයක් සභාව විසින් සිදුකර නොතිබුණි. | සඳහන් කළ වර්ෂයන්ට අදාල පොත් සමීක්ෂණ කටයුතු සිදුකිරීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගනිමින් පවතී. | පුස්තකාල පොත් සමීක්ෂණය නියමිත කාලවකවානු තුල සිදුකළ යුතුවේ. |

**3.2** **අභාවිත සහ ඌන උපයෝජිත දේපළ, පිරියත සහ උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහයෝගිතා සම්බන්ධිත ආර්ථිකය ශක්තිමත් කිරීමේ සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන (2018/19) යටතේ රු. මිලියන 20ක මූල්‍ය ප්‍රතිපාදනයෙන් ඉදිකළ වෙන්කලාඩි වෙළෙඳපොල සංකීර්ණය විගණන දිනය වන විටත් භාවිතා කර නොතිබුණි. | කානු පද්ධතිය ඉදිකිරීමෙන් පසුව වෙළඳ පොල ව්‍යාපාරිකයින්ට මාළු විකිණීම සඳහා උපදෙස් ලබා දී ඇත. | වෙළෙඳපොල ගොඩනැගිල්ල නිශ්චිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

**3.3** **ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කරඩියනාරු යන ස්ථානයේ JICA ණය ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය පවුල් 400කට පමණ පානීය ජලය බෙදාහැරීම සඳහා රු. මිලියන 40ක වියදමින් 2015 වර්ෂයේ ඉදි කළ පානීය ජල සැපයුම් ව්‍යාපෘතිය සඳහා සභාව විසින් 2016 සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. මිලියන 4.59ක් වැය කර තිබුණි. එසේ වුවත්, විගණන දිනය වන විටත් ජනතාවට ජලය නොසපයා අත්හැර දමා තිබූ බව දක්නට විය. | කරඩියනාරු පානීය ජලය බෙදාහැරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ වත්කම් හා ලියකියවිලි කිසිවක් අප සභාවට භාරදී නොතිබුණි. | ජල ව්‍යාපෘතිය සක්‍රිය කිරීමට පියවර ගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ තනතුරු 11ක සඳහා පුරප්පාඩු 19ක් පුරවා නොතිබුණි. | කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සභාව අවධානය යොමුකර ක්‍රියාමාර්ග ගෙන ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව වෙනස් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | විශ්‍රාම ගිය, සේවයෙන් ඉවත්වූ සහ ස්ථාන මාරුවීම් ලබාගිය සේවකයින් 03 කගෙන් අයවිය යුතු රු. 117,131ක හිඟ ණය අදාල පුද්ගලයින්ගෙන් හෝ නැතහොත් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට පසුගිය වර්ෂ 03ක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කිහිප අවස්ථාවකදීම ලිඛිතව අදාල පුද්ගලයින්ට යවා ඇත. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 134 හි විධිවිධාන ප්‍රකාරව සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අප සභාවට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර විගණන කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබේ. | අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මකකිරිමට කටයුතු කළ යුතුවේ. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හා සම්බන්ධ ඉලක්ක පදනම් කරමින් සංවර්ධනයන් ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |